සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**ThirdTerm Test - Grade 13 - 2018**

විභාග අංකය ................................ පෙරදිග සංගීතය I කාලය පැය දෙකයි

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 26 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. ම ප ධ නි | ස් - නි ස් | ධ නි ස් ග් | රි් ස් ධ ප | යනුවෙන් අන්තරා ආරම්භ වන සර්ගමය අයත් රාගය වනුයේ,

i. බිහාග් රාගය ii. ජෞනපුරි රාගය iii. දේශ්රාගය
iv. ආශාවරි රාගය v. බහාර් රාගය (........)

02. පහත රාග වලින් සමප්‍රකෘති රාග යුගලයක් වන්නේ,

i. දේශ් රාගයයි භාගේශ්‍රී රාගයයි ii. ආශාවරි රාගයයි, ජෞනපුරි රාගයයි.
iii. හමීර් රාගයයි, බහාර් රාගයයි. iv. මාලාකෞන්ස් රාගයයි බාගේශ්‍රී රාගයයි.
v. තිලක්කාමෝද් රාගයයි, ජයජයවන්ති රාගයයි. (........)

03. සංගීතය හා නර්තනය යන විෂයන්ට පොදු මූලධර්මයකි.

i. ස්වරය ii. රාග, තාලය iii අභිනය iv. රිද්මය v. මේල රාග ක්‍රමය (........)

04. මාත්‍රා 16 - 14 කින්යුත් තාල දෙකක ඛලි ස්ථානය පිහිටන මාත්‍රාව පිළිවෙළින් ඇතුලත් පිළිතුර වන්නේ,

i. 9 -8 ii. 8 - 9 iii. 9 - 7 iv. 8 - 8 v. 9 - 6 (........)

05. ධෘපද් ගායන ශෛලිය සඳහා වඩාත් සුදුසුම තාලය වන්නේ,

i. ත්‍රිතාල් ii. ධමාර් තාලය iii. චෞතාලය
iv. දීප්චන්දි තාලය v. ඒක්තාලය (........)

06. ම - ස වාදී සංවාදී ලෙස යොදා ගන්නා රාග දෙක ඇතුලත් පිළිතුර වන්නේ,

i. බහාර් - දේශ් ii. ජයජයවන්ති - භාගේශ්‍රී iii. මාලකෞන්ස් - දේශ්
iv. භාගේශ්‍රී - මාලකෞන්ස් v. භාගේශ්‍රී - බින්දාමනි සාරංග (........)

07. නිර්දේශිත තාල පදයක් ආවර්ථ දෙකක් වාදනය කළ විට තවත් තාලයක එක් ආවර්ථයක මාත්‍රා ගණනට සමාන වේ. එම තාල දෙක පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ඒක් තාලය- ජප් තාලය ii. රූපක් තාලය - චෞතාලය iii. ත්‍රිතාලය - රූපක් තාලය
iv. දීප් චන්දි තාලය - ධාදරා තාලය v. රූපක් තාලය - දීප්චන්දි තාලය (........)

08. ප්‍රශස්ති ගීත හා බැඳුනු විශේෂ ලක්ෂණයකි.

i. ඉන්නිසය ii. තෝඩායම iii. අඩච්ච
iv. මුද්‍ර පදය v. ඉරට්ටිය (........)

09. රාග දෙකක් වෙන්කර හඳුනා ගැනීමට උපකාරී වන්නේ,

i. වාදී - සංවාදී ස්වරයන්ය. ii. ගාන සමයන්ය. iii. රාග සංගතීන්ය.
iv. මේලයන් ය. v. රාග ජාතීන්ය. (........)

10. අළුයම 4.00 සහ පෙ.ව.7.00 අතර ගායන සමය තුළ ගයන රාගයන්ගේ විශේෂ ලක්ෂණයක් වන්නේ,

i. කෝමල රි තිව්‍රම, කෝමල නි යෙදීමෙනි.
ii. ශුද්ධ රි සහ ශුද්ධ ග යෙදීමයි.
iii. ශුද්ධ රි සහ කෝමල ධ, සහ ශුද්ධ ම යෙදීමයි.
iv. කෝමල රි සහ කෝමල ග, කෝමල ධ යෙදීමයි.
v. කෝමල රි සහ කෝමල ධ ශුද්ධ ම යෙදීමයි. (........)

11. පංච ජාති භේදය පදනම් කර ගනිමින් තාල නිර්මාණය වී ඇත්තේ,

i. හින්දුස්ථානි සංගීතයේය. ii. කර්ණාටක සංගීතයේය. iii. බටහිර සංගීතයේය.
iv. චීන සංගීතයේය. v. ඉස්ලාමික සංගීතයේය. (........)

12. ඛ්‍යාල් ගායනයේදී ත්‍රිවිධ සප්තකයම ඇසුරු කිරීමේ හැකියාව ඇති ගායිකාවකි.

i. තුල්සිදාස් ii. කබීර්දාස් iii. පන්කජ් උදාස්
iv. පර්වින් සුල්තානා v. මීරාබායි (........)

13. ' මාල කෞන්ස් ' රාගය ඇසුරු කර නිර්මාණය කරන ලද සරල ගීයකි.

i. මුවමුක්තාලතා ii. මම දෙව්දුනි දෙවොලට iii. මාරම්බරී
iv. හංසරාජනී v. හෝපලු වන පෙත (........)

14. සරිස, ගමධ, ප / සගමගස, ගමධනිධම, ධ යන ස්වර සංගති වලට අදාල රාග යුගල පිළිවෙලින් ඇතුලත් පිළිතුර කුමක්ද?

i. ජෞනපුරි - මාලකෞන්ස් ii. කේදාර් - දේශ් iii. හමීර් ජෞනපුරි
iv. මාලකෞන්ස් - හමීර් v. හමීර් - මාලකෞන්ස් (........)

15. පහත දැක්වෙන ගී වර්ග අතරින් මෙහෙගී ගණයට අයත් ගී සමුහය ඇතුලත් පිළිතුර තෝරන්න.

i. කෙලි ගී, පාරු ගී, - ප්‍රශස්ති ගී, ගැල් ගී ii. පතල් ගී, බඹර ගී - ගොයම් ගී, පාරු ගී
iii. තුන්සරණේ ගී, බඹර ගී - ගොයම් ගී, ප්‍රශස්ති ගී iv. ප්‍රශස්ති ගී, ගොයම් ගී - නෙළුම් ගී, කමත් ගී
v. හටන් ගී, වැලපුම් ගී - පාරු ගී, කමත් ගී (........)

16. Brass wind සංගීත භාණ්ඩ වර්ගයට අයත් නොවන සංගීත භාණ්ඩය කුමක්ද?

i. ට්‍රම්පට් ii. ඉයුෆෝනියම් iii. ඕබෝ
iv. ත්‍රොම්බෝන් v. සැක්සෆෝන් (........)

17. දේශීය සංගීතයේ දී " ∧ " " / " මෙම ලකුණු දෙක හඳුන්වන්නේ පිළිවෙළින්,

i. 'තෙයි' තිත් නමිනි ii. 'සමග්‍රහ තිත් නමිනි iii. තෙයි සමග්‍රහ නමිනි.
iv. තිත් තෙයි නමිනි v. විරාම, තිත් නමිනි (........)

18. ධෲපද් සහ ධමාර් ගීත වලට ඇතුලත් නොවන්නේ මින් කුමක්ද?

i. ආලාප ii. ස්ථායි iii. අන්තරා iv. අභෝග v. තානාලංකාර (........)

19. සරල ගීතයක ප්‍රධාන ගීතතනුව ගයන විට එහි අර්ථය තිව්‍ර වන අයුරින් ඊට සමාන්තරව වාදනය කරනු ලබන ස්වර කාණ්ඩය හඳුන්වනු ලබන්නේ,

i. ඉන්ටර්ලූඩ් (Interlude) ii. (Introduction) ඉන්ට්‍රොඩක්ෂන් නමිනි.
iii. කෝඩ්ස් (Chords) iv. කවුන්ටර් පොයින්ට් (Counterpoint)
v. ස්කේල් නමිනි (Sale) (........)

**අංක 20 සිට 24 තෙක් ප්‍රශ්නවලට පහත සංගීත ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**

| ප නි̣ ස රි | ග - ස ස | රි රි (ම) ප | ග ග - ස |
| රි ම ප ධ | ම ප ස̇ - | ස̇ ප ධ ම | ග ග - ස |

20. ඉහත ප්‍රස්ථාරයේ ස්වර රචනාව ආශ්‍රය කර ඇත්තේ කුමන රාගයද?

i. බිහාග් ii. තිලක්කාමෝද් iii. දේශ්
iv. බ්‍රින්දාමනිසාරංග v. බහාර් (........)

21. මෙම ස්වර ප්‍රස්තාරයෙහි මූර්කි ස්වරයක් සහිත ස්වර සංගතිය කුමක්ද?

i. රි ම ප ධ ii. ග - ස ස iii. ප නි ස රි
iv. ස ප ධ ම v. රි රි (ම) ස (........)

22. ඉහත ස්වර ප්‍රස්ථාරයේ පළමු පාදයේ විභාගමත යෙදිය හැකි සුදුසුම Chords මොනවාද?

i. C F G C ii. G G C G iii. C G G C
iv. G C G C v. C C G C (........)

23. එම ස්වර ප්‍රස්තාරයේ දෙවන පාදයේ විභාගමත යෙදිය හැකි සුදුසුම Chords මොනවාද?

i. F F F C ii. G G C G iii. C G G C
iv. G C G C v. C C G C (........)

24. ඉහත ස්වර ප්‍රස්ථාරයේ දෙවන පේලිය මධ්‍යම භාවයෙන් ලියූ විට

i. | ප නි ස̇ රි̇ | ස - ග ග | ම ම (ප) ධ | ධ ධ - ම |
ii. | ප නි ස රි | නි ස̇ ම̇ - | ම̇ ස̇ රි̇ නි̲ | ධ ධ - ම |
iii. | නි ස̇ - ම | ප නි̲ ස̇ රි̇ | ම ම ධ ප | ම ම - ධ |
iv. | ප නි ස̇ රි | ස̇ ස̇ - ම̇ | ම̇ රි̇ ස̇ රි̇ | ප ම - ම |
v. | ප නි̲ ස රි̇ | නි ස̇ ම - | ග ස̇ රි නි̲ | ධ ප - ම | (........)

25. $B^6$ (Major Chord) බී ප්ලැට් මේජර් කෝඩ් එකට අයත් ස්වර ඇතුලත් පිළිතුර කුමක්ද?

i. නි̲ + රි + ම ii. නි + ග + ම iii. රි + ම + නි
iv. නි + රි + ම́ v. නි + රි + ප (........)

- **26 සිට 50 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු හිස්තැන්වල ලියන්න.**

උඩරට නර්තන සම්ප්‍රදාය අයත් ප්‍රධාන ශාන්තිකර්මය (26) ....................................... වන අතර 'සොඳින හඬ නගා දෙපයින්' යන ගී පාදය (27) ........................................... ශාන්තිකර්ම ගී ගණයට අයත්වේ. නළු ගීතිකා තාලය (28) ...................................................... නර්තන සම්ප්‍රදායට අයත් වන අතර ජෙං කිට තත් කිටි තක (29) .................................................... සම්ප්‍රදායේ බෙර පදයකි. එම සම්ප්‍රදායේ වන්නම් ආකෘතිය කොටස් (30) ...................................................... කින් සමන්විත වේ.

**31 සිට 35 තෙක් දී ඇති ඡේදයේ හිස්තැන් වලට අදාල සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.**

භාරතිය සංගීතයේ ප්‍රභවය වේද ඇසුරින් සිදු වූ අතර එයින් සංගීතයට වඩාත් සමීප වූයේ (31) ........................... වේදයයි. වේද ගීතිකා ගැයීම (32) ................................................ අනුදත්ත (33) ................................... යන නාද ස්ථාන තුනක් ඔස්සේ සිදු වී ඇත. ධ්‍රැපද් ගායන ශෛලිය (34) ..........................................................විසින් ආරම්භ කළ අතර (35) ........................................ සාරංග දේව පඬිතුමා විසින් රචිත ග්‍රන්ථයකි.

36. MIDI යන කෙටි යෙදුමෙහි අර්ථය ලියන්න. ..........................................................................................

37. සත් සමුදුර චිත්‍ර පටියේ තේමා ගීතයේ සුවිශේෂී ලක්ෂණය කුමක්ද?

.................................................................................................................................................................

38. සංගීත නිර්මාණ කාර්යයේදී සහ අධ්‍යාපන කටයුතු වලදී පරිගණකය යොදා ගත හැකි අවස්ථා දෙකක් නම් කරන්න.

..................................................................................... .....................................................................................

39. සංගීත රිද්මයානුකූල බුද්ධිය මුල්කරගත් වෘත්තිකයන් දෙදෙනෙකු නම් කරන්න.

..................................................................................... .....................................................................................

40. සංගීත භාණ්ඩයක ධ්වනි ගුණය වෙනස්වීමට බලපාන කරුණු දෙකක් ලියන්න.

.................................................................................................................................................................

.................................................................................................................................................................

41. මධ්‍ය 'ස' ස්වරයේ සංඛ්‍යාතය 265 කි. මධ්‍ය ග ස්වරයේ හා මධ්‍ය 'ප' ස්වරයේ සංඛ්‍යාතයන් පිළිවෙලින් ලියන්න.

.................................................................................................................................................................

42. මානස විල ඔපෙරාව නිර්මාණය කළේ කවුරුන් විසින්ද?

.................................................................................................................................................................

43. සංධ්වනියක දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

..................................................................................... .....................................................................................

44. වැදි ගී ආශ්‍රයෙන් නිර්මාණය වු සරළ ගී 02 ක් ලියන්න.

..................................................................................... .....................................................................................

45. සිතාරයේ සහ තාම්පුරාවේ යොදා ඇති මන්කාවෙන් සිදු කර ගන්නා කාර්යය කුමක්ද?

.................................................................................................................................................................

46. කෝලම් නාට්‍යයේ සහ නාඩගම් රංග ශෛලියේ රංග භූමි පිළිවෙලින් ලියන්න.

.................................................................................................................................................................

47. කර්ණාටක සංගීතයේ භාවිතා වන ගායන ශෛලින් දෙකක් නම් කරන්න.

..................................................................................... .....................................................................................

48. ස්වර හැඳින්වීමේදී ල්‍යු (Lu) සහ ස්ලෙන්ද්‍රෝ යනුවෙන් ස්වර නාම භාවිතා කරන සංගීත පද්ධති දෙක පිළිවෙලින් ලියන්න.

49. දේශීය ඉගිනළුව (මුද්‍රානාට්‍ය) සහ ගීත නාට්‍ය නිර්මාණයට අභාෂය ලබාගත් බටහිර නාට්‍ය අංග දෙක පිළිවෙලින් ලියා දක්වන්න.

.................................................................................................................................................................

50. දේශීය තාල පද්ධතිය තුළ තනි තිතෙහි හා දෙතිතෙහි ප්‍රභේද ගණන පිළිවෙලින් ලියන්න.

.................................................................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

54 | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .................................    පෙරදිග සංගීතය II    කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත සඳහන් ස්වර සංගති වලට අදාල රාගය නම් කර ඒවායෙහි ආරෝහණ, අවරෝහන, වාදි, සංවාදී යන රාග විස්තර ලියා දක්වන්න.

I. ධ̣ නි̣ ස, මග, මධනිධ මගරිස

II. ධ නි ස්, නි ප, මප, ගමරිස

III. ගමපස්, නිප, ගමගස

IV. නි̣ස, ධනි̣රිරි, ගමප, ගමරිගරිස    (ල. 4 x 5 = 20)

2. නිර්දේශිත රාග කිහිපයකට අදාල කර ගත හැකි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

a) රාග ජාතිය සම්බන්ධයෙන් මත තුනක් ප්‍රකාශ වන කාෆිමේල ගත රාගයකි.

b) ඛමාජ් මේලගත රාත්‍රි තුන්වන ප්‍රහරයේ ගැයෙන රාගයකි.

c) තිව්‍ර (ම්) මධ්‍යමය විවාදී ස්වරයක් වශයෙන් යෙදෙන බිලාවල් මේලගත රාගයකි.

d) ආසාවරි රාගයේ සමප්‍රකෘති රාගයකි.

i. ඉහත තොරතුරු අනුව එක් එක් රාගය නම් කරන්න.    (ල.4)

ii. d සහ C යන රාග දෙකෙන් එකකට අයත් මධ්‍යලය ගීතයක හෝ සර්ගමයක හෝ වාදිතයක ස්ථායි කොටසක් ස්වර ප්‍රස්ථාර කරන්න.    (ල. 06)

iii. B සහ D රාග වලට අදාලව (මාත්‍රා 08 කට නො අඩු) තානාලංකාර දෙක බැගින් ලියන්න.    (ල. 04)

iv. ඉහත රාග අතරින් කැමති රාගයකට ස්වර 30 කට නොඅඩු වන සේ ආලාප කණ්ඩයක් ලියන්න.    (ල. 04)

v. B රාගයට සම ප්‍රකෘති වන රාගය නම් කරන්න.    (ල. 02)

03. පහත දැක්වෙනුයේ නිර්දේශිත තාල 05 කට අයත් තොරතුරු වේ.

a) පඛ්වාජ්යෙන් වාදනය කරන මාත්‍රා 12 ක තාලයකි.

b) තිරිකිට යනුවෙන් දෙවරක් වැයෙන 9 වන මාත්‍රාවෙහි බලිස්ථානය යෙදෙන තාලයකි.

c) හෝලි (හෝරි) උත්සවය සම්බන්ධව වාදනය කරන තාලයකි.

d) සුළු මැදුම් දෙතිතට සමානව මාත්‍රා කැටිවන තාලයකි.

e) තිරිකිට යනුවෙන් දෙවරක් යෙදේ. අනු තාලස්ථාන තුනකි.

ඉහත තොරතුරු ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඉහත (A) (B) (C) (D) (E) කරුණු වලට අදාල තාල ඉංග්‍රීසි අක්ෂරයද සමග නම් කරන්න. (ල. 05)

ii. ඉහත E අක්ෂරයට අදාල තාලයේ ඨේකාව සමගුණ හා දෙගුණ වශයෙන් තාල සංකේත සහිතව ප්‍රස්ථාර කරන්න. (ල. 05)

iii. A සහ C තාල දෙක යොදාගන්නා ගායන ශෛලින් දෙක නම් කර ඉන් එක් ගායන ශෛලියක් පිළිබඳව කරුණු 04 ක් ලියන්න. (ල.05)

## II කොටස

04. i. කෝලම්, නාඩගම්, නූර්ති යන රංග ශෛලීන් අතරින් ඔබ කැමති රංග ශෛලීන් දෙකක් පිළිබඳව පහත කරුණු ඇසුරින් විමසීමක් කරන්න.

(1) ආරම්භය හා විකාශනය

(2) සංගීතමය ලක්ෂණ

(3) නාට්‍යමය ලක්ෂණ

(4) මෙම රංග ශෛලින් තුලින් ලාංකීය සමාජ ලබාගත් ප්‍රයෝජන (ල. 20)

05. පහත දැක්වෙනුයේ දේශීය ජන ගී කිහිපයක මුල් ගී පාද අටකි.

- වගේ මම කියම් අසතොත් සිතු ලෙසින
- පෙර කාලේ කරපු අකුසල් පල දීලා
- වරමති සුභ චරිතේ
- පුරන සමුදුර දුවන නැව් දැකලා
- පෙම්මා සුරතල් කියමින්
- පැට්ටි අඩන්නේ මොන්නටදෝ බොල
- පෙමින මිතුරු කුලුනු ගුනෙණ
- ගුණ දැනේ බෝසත් අනේ

i. ඉහත ගී පාද ගැමි ගී හා සේ ගී වශයෙන් වෙන්කර ලියා දක්වන්න. (ල. 04)

ii. ඉහත තොරතුරු වල ඇතුලත් මහනුවර යුගයේ කවිකාර මඩුව ඇසුරෙහි භාවිතා වු ගීත විශේෂයෙහි සංගීත කරුණු 04 ක් ලියන්න.

(ල. 04)

iii. ඉහත සඳහන් ගී පාද අතරින් ඔබ කැමති ආසාත්මක ගීත පාදයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ල.06)

iv. සේ ගී හා ගැමි ගී පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රයහක් කරන්න. (ල.06)

## III කොටස



06. i. ඉහත බටහිර ස්වර ප්‍රස්ථාරය පෙරදිග ස්වර ප්‍රස්ථාර ක්‍රමයට ලියන්න. (ල.08)
    ii. ඉහත ප්‍රස්ථාරයට ගැලපෙන කෝඩ්ස් (Chords) යොදන්න. (ල.04)
    iii. ඉහත ඔබ පෙරදිග ක්‍රමයට ලියූ ප්‍රස්ථාරය මධ්‍යම භාවයට හරවා නැවත ලියන්න. (ල.04)
    iv. ඉහත බටහිර ප්‍රස්ථාරයේ ඇතුලත් සංකේත 04 ක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල.04)

07. පහත දැක්වෙන මාතෘකා හතරක් පිළිබඳ කෙටි සටහන් උදාහරණ සහිතව ලියන්න. (එක් මාතෘකාවක් සඳහා සුවිශේෂි කරුණු පහක් ඇතුලත් විය යුතුය.)
    i. සංගීත විෂයේදී නාදය ඇසීමට උපකාරී වන කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරීත්වය
    ii. පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය
    iii. ශාස්ත්‍රීය සංගීතයේ ගායනය හදාරණ ආධුනිකයකුට ස්වසන අභ්‍යාසවල ඇති වැදගත්කම
    iv. රාගධාරී සංගීතය ආශ්‍රයෙන් බිහිවූ සිංහල සරල ගී
    v. ශ්‍රී ලංකාවේ සංගීත විකාශනයට මහනුවර යුගයේ බලපෑම

08. පහත වගුවෙහි හිස්තැන්වලට ගැලපෙන කරුණු අදාල රෝම ඉලක්කම සමඟ ලියා දක්වන්න. (ල.06)

| | **ගායන ශෛලිය හෝ වාද්‍ය භාණ්ඩය** | **ඉන්දියානු ශිල්පියකු** | **ශිල්ප ක්‍රමයකි** | **ගායන / වාදන ශෛලිය පිළිබඳ විශේෂතාවයක්** |
|---|---|---|---|---|
| A | I ……………………... | රවිශංකර් | II ……………………... | III ……………………... |
| B | එස්රාජ් | IV ……………………... | ගායකි ක්‍රමයට වැයීම. ජලාවාදනය | අළුවෙන් වැයීම |
| C | V ……………………... | මීරාබායි | සරල රාග යොදා ගැනීම | VI ……………………... |
| D | වයලින් | VII ……………………... | ගත් වාදනය ජලා වාදනය | VIII ……………………... |
| E | IX ……………………... | ශකීර්හුසේන් | X ……………………... | කුලා පද සහ බන්ද් බෝල් වැයීම |
| F | ඛ්‍යාල් | XI ……………………... | රාග ගායනය | XII ……………………… |

i. C (V) හි ගායන ශෛලිය පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 04)
ii. A ( I) හි සංගීත භාණ්ඩයෙහි දළ රූපසටහනකින් ස්වර පිහිටීම ලකුණු කරන්න. (ල. 05)
iii. F තීරුවට අදාල ගායන ශෛලිය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 05)

## තෙවන වාර පරීක්ෂණය 2018 - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය

## පිළිතුරු

## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 2 | 21. | 5 |
| 2. | 2 | 12. | 4 | 22. | 4 |
| 3. | 4 | 13. | 4 | 23. | 1 |
| 4. | 1 | 14. | 5 | 24. | 2 |
| 5. | 3 | 15. | 2 | 25. | 1 |
| 6. | 4 | 16. | 3 | | |
| 7. | 5 | 17. | 4 | | |
| 8. | 4 | 18. | 5 | | |
| 9. | 3 | 19. | 4 | | |
| 10. | 5 | 20. | 2 | | |

**(ලකුණු 1x25=25)**

**26 සිට 50 දක්වා පිළිතුරු වලට ලකුණු භාග (½) හිමි නොවේ.**

26. කොහොඹා කංකාරිය
27. සබරගමු
28. පතරට
29. සබරගමු
30. පහකින්
31. සාම
32. උදාත්ත
33. ස්වරිත
34. තාන්සේන්, / රාජ මාංසිං තෝමර්
35. සංගීත රත්නාකරය
36. Musical Instrument Digital Interface (සංගීත භාණ්ඩයන්ගේ නාද විද්‍යුත් ක්‍රමයකට සැකසීම)
37. සංධ්වනි ලක්ෂණයකි.
38. සංගීත කෘති සංරක්ෂණයට / සංගීත පටිගත කිරීම් වලට / අන්තර් ජාලය ඇසුරින් සංගීතමය තොරතුරු බාගත කර ගැනීමට ආදී වශයෙන්.
39. සංගීතඥයා, සංගීත ස්වර රචකයා, ගායකයා, වාදනකයා, සංගීත රසවතා සංගීත විචාරකයා, ශබ්ද පරිපාලක සංගීත ගුරුවරයා, මේ අතරින් දෙදෙනෙකු
40. භාණ්ඩය නිර්මාණය කිරීමට යොදාගත් අමුද්‍රව්‍ය
    භාණ්ඩයේ හැඩය දිග - පළල / වාදන ශෛලීන්
41. ග - 320 ප - 384
42. ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහතා
43. නිවැරදි පිළිතුරු වලට ලකුණු දෙන්න.
44. නංගීට බැඳපු මල් වියනයි / රාජාඹී මංගලියා / මල් වියනෙන් බැදි මහ බැද්දේ / මල් නැති මං කැකුලි මං / කොටාදමඤ්ඤං මර මර / මල් පැණි දී
45. තත් සියුම් ව සුසර කර ගැනීමට
46. තානායම්පොල / කරලිය
47. වර්ණම් / තිල්ලානා
48. චීන / ගැම්ලැන්
49. බැලේ (Ballet) ඔපෙරා (Opera)
50. තනි තිතෙහි ප්‍රභේද - 03 කි. සුළු තනි තිත / මැදුම් තනි තිත / මහ තනි තිත
    දෙතිතේ ප්‍රභේද - 03 කි. සුළු මැදුම් දෙතිත / මැදුම් මහ දෙතිත / සුළු මැදුම් දෙතිත

**දෙවන වාර පරීක්ෂණය - පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය**
**II පත්‍රය**

- **I, II, III කොටස් වලින් ප්‍රශ්න තෝරා ගැනීම නිවැරදි විය යුතුය.**

01. රාගය නම් කිරීමට ල. 01 ආරෝහණ ල. 01 අවරෝහණ ල. 01
වාදි ල. 01 සංවාදී ල. 01
**එක් රාගයක් සඳහා ල. 05 රාග 04 හි විස්තර සැපයීමට 5 x 4 = 20**

02. i රාග 04 නම් කිරීමට (ල. 01 x 04 = 04)
ii. ප්‍රස්ථාරයට (ල. 04) නිවැරදි තාල සංඥාවලට (ල. 02) (ල. 06)
iii. නිවැරදි ස්වර සංඥා යොදා රාගයට අදාලව තානාලංකාර ලියා ඇත්නම් (ල.04)
iv. නිවැරදි ස්වර සංඥා යොදා ස්වර 30 ට නොඅඩුව රාගයට අදාලව ආලාප ලියා ඇත්නම් (ල.04)
v. සමප්‍රකෘති රාගය නම් කිරීමට (ල.02)

03. i. අදාල ඉංග්‍රීසි අක්ෂරය සමග තාල නම් කිරීමට (ල.05)
ii. සමවිෂම 05 ක් ලිවීමට (ල. 05)
iii. තාල සංකේත සහිතව සමදෙගුණ ප්‍රස්ථාර කිරීමට (ල. 05)
iv. ගායන ශෛලින් නම්කර කරුණු 04 ක් ලිවීමට (ල. 05)
C - ත්‍රී තාලය - මහ තනි තිත

04. දී ඇති කරුණු වලට අදාලව කරුණු ගොනුකර ඇත්නම් (ල. 20)

05. i. ගැමි ගී / සේ ගී වශයෙන් වෙන්කර ලිවීමට (ල. 04)
ii. සංගීතමය කරුණු 04 ක් ලිවීමට (ල. 06)
iii. ගී පාදයක් ප්‍රස්ථාර කිරීමට (ල. 06)

06. I. පෙරදිග ස්වර ප්‍රස්ථාර ක්‍රමයට ලිවීමට (ල. 08)
II. කෝඩ් යෙදීමට (ල. 04)
III. මධ්‍යම භාවයට හරවා තිබීමට (ල.04)
IV. සංකේත 04 ක් විස්තර කිරීමට (ල.04)

07. I එක් මාතෘකාවකට අදාලව සුවිශේෂි කරුණු 05 ක් ඇතුලත්ව මාතෘකා 04 ක් පිළිබඳ කෙටි සටහන් ලිවීමට (ල. 1-4 x 5 =20)

08. I. සිතාරය II. ජලාගන් / ආලාප / කින්තන් III. මිශ්‍රාබයෙන් වැයීම
IV. අශිස් බැනර්ජි V. භජන් VI. දේවභක්ති උදෙසා ගැයීම
VII. V.G. ජෝග් / N. රාජන් / ලාල් ගුඩී ජයරාමින් / T.N. ක්‍රිෂාන්
VIII. අළුවෙන් වැයීම
IX. තබ්ලාව X. කායදා / පල්ටා/ ගත්/ මුඛටා / ටුබඩා
XI. බිම්සින් ජෝසි / උස්තාද් අමීර් ඛාන් / පණ්ඩිත් ජස්රාජ් / පර්වින් සුල්තානා
XII. අලාප / තානාලංකාර ගැයීම (ල. ½ x 12 = 06)

II. ගායන ශෛලිය විස්තර කිරීමට (ල. 04)
සුවිශේෂි කරුණු 04 ක්වත් ඇතුළත්)
III. ස්වර පිහිටීම ලකුණු කිරීමට (ල. 05)
IV. අදාල ගායන ශෛලිය පිළිබඳ කෙටි විස්තර කිරීමට (ල. 05)
(සුවිශේෂි කරුණු 05 ක් වත් ඇතුලත්ව)